## පොල් වගා කිරීමේ මණ්ඩලය

### 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, පොල් වගා කිරීමේ මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

වර්තමානයේදි ප්‍රයෝජනයට ගන්නා එහෙත් සම්පූර්ණයෙන් ක්ෂය කර පොත් අගය ශුන්‍ය ලෙස දැක්වෙන පිරිවැය රු 110,048,336 ක් වූ වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පිළිවෙලින් රු.3,577,776 ක් හා රු.2,417,284 ක් වූ ණයහිමි හා ණයගැති සඳහා වූ ශේෂ සනාථ කිරීම් නොලැබීම නිසා ඒවායේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

1.2.3 **නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ | |
| (i) 4.2.2 ජේදය හා 7.4.1 ජේදය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ii) 5.1 ජේදය | පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵලයන්හි සමාලෝචනයක් හා සංවිධාන සැලැස්ම සංයුක්ත සැලැස්ම තුල අන්තර්ගත විය යුතු නමුත් එවැන්නක් ඇතුලත් කර නොතිබුණි. |
| (iii)5.2 ජේදය | වාර්ෂික අයවැය ලේඛනයෙහි එක් එක් මුදල් වර්ෂය සඳහා අයවැය ගත අදායම් වියදම් ගිණුමක්, අයවැය ගත ශේෂ පත්‍රයක් සහ අයවැය ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඇතුලත් කලයුතු නමුත් 2010 වර්ෂයේ අයවැය ලේඛණය තුල ඒවා පෙන්නුම් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.104(2) | රු.50,000 ට වැඩි පාඩු සම්බන්ධයෙන් වූ වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයට යවා නොතිබුණි. |

2 **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය සමාලෝචනය**

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, එකතුව රු.662,597,042 ක් වූ රජයෙන් හා පොල් සංවර්ධන අධිකාරියෙන් ලද සෙස් ඇතුළු අනෙකුත් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.186,428,747 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපිව එකතුව රු.473,578,883 ක් වූ රජයෙන් හා පොල් සංවර්ධන අධිකාරියෙන් ලද සෙස් ඇතුළු අනෙකුත් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.56,137,117 ක් විය. ඉකුත් වර්ෂයට වඩා සෙස් ප්‍රදානය

රු. මිලියන 179 කින් වැඩිවීම, මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වාසිදායක ප්‍රගතියට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.1.2 <u>මූල්‍ය ප්‍රතිඵලයේ වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණය</u>

**(අ)** සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන් වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.55,306,367 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඒ හා සසඳන විට ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු.63,530,699 ක් විය.

**(ආ)** සමාලෝචිත වර්ෂය තුල පොහොර ඒකකය රු.9,689,058 ක ඌණතාවයක් ලබා තිබූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,580,325 ක් විය. ඊට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ පොහොර සහනාධාර ක්‍රමයට නිකුත්කිරීම හේතුවී තිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂය තුල කප්රුක ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,022,521 ක අතිරික්තයක් වූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.1,200,045 විය.

**(ඈ)** මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය මුලු වත්කම් වලින් 18 % ක් විය.

**(ඉ)** මණ්ඩලයේ මුලු ආදායම් වලින් 92% ක් රජයෙන් හා වෙනත් ප්‍රදානයන්ගෙන් ලැබී තිබූ අතර 08% ක් ආදර්ශ පොල් උයන් , පොල් පැල තවාන් හා විවිධ ආදායම් වලින් ලැබී තිබුණි.

2. 2 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

ව්‍යාප්ති අංශය, රෝපන ද්‍රව්‍ය හා යෙදවුම් අංශය, සැලසුම් අංශය, ආයතන හා පිරිස්බල සංවර්ධන අංශය සහ මූල්‍ය කළමණාකරන අංශය යනුවෙන් පොල් වගා කිරීමේ මණ්ඩලය අංශ 5කින් සමන්විත වී තිබුණි.
සමාලෝචිත වර්ෂය තුල එක් එක් කාර්යයන්ගේ ඉලක්ක සහ සපුරා ගැනීම් සාරාංශ කර පහත දැක්වේ.

2.2.1 <u>සහනාධාර ගෙවීම්</u>

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සහනාධාර ක්‍රම කිහපයක් ක්‍රියාත්මකකර පවත්වාගෙන ගොස් තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩ සටහන් වල ඉලක්කය හා ප්‍රගතිය පහත පරිදි විය.

| සහනාධාර වැඩ සටහන | මිණුම් ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය සංඛ්‍යාව | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | 2010 | 2009 | 2010 | 2009 | 2010 | 2009 |
| පොල් නව / නැවත / යටි වගා සහනාධාර ක්‍රමය | අක්කර | 18,000 | 20,000 | 14,900 | 18,642 | 83 | 93 |
| පොල් ඉඩම් පුනරුත්ථාපනය | අක්කර | 10,000 | 10,000 | 7,046 | 5,472 | 70 | 55 |
| ජාතික ගෙවතු පොල් වගා වැඩ සටහන | පොල් පැළ | 800,000 | 885,000 | 757,853 | 808,480 | 94 | 91 |
| පොල් පොහොර සහනාධාරය | මෙ:ටොන් | 4,200 | 8,750 | 5,185 | 1,833 | 123 | 21 |
| කප්රුක ආයෝජන වැඩ සටහන | අක්කර | 2,950 | 1,506 | 1,634 | 1,287 | 55 | 85 |
| ගවගාල් සහනාධාර වැඩ සටහන | ගවගාල් | 750 | - | 302 | - | 40 | - |
| අතුරු භෝග වගා වැඩ සටහන | අක්කර | 1,725 | - | 1,014 | - | 59 | - |
| වැසි ජල සංරක්ෂණ වැඩ සටහන | පතස් | 27 | - | 16 | - | 59 | - |
| ග්ලිරිසීඩියා සහනාධාර වැඩසටහන | අක්කර | 250 | 1,590 | 186 | 152 | 74 | 10 |

(අ) <u>නව/නැවත/යටි වගා සහනාධාරය</u>

පොල් නව/නැවත/යටි වගාව යටතේ අක්කර 18,000 ක් වගා කිරීමට ඉලක්ක කර තිබුණත් මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව අක්කර 14,900 ක් වගා කර තිබුණි. ඒ අනුව, එහි භෞතික කාර්යසාධනය 83% ක් විය. එසේ වුවද ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් හා පොල් සංවර්ධන නිලධාරි කොට්ඨාශ මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී, උතුරු ප්‍රාදේශීය කාර්යාලයේ හා පොල් සංවර්ධන නිලධාරි කොට්ඨාශ 162 න් කොට්ඨාශ 11 ක සමස්ථ කාර්ය සාධනය පිළිවෙලින් 5% ක් හා 50% කට වඩා අවම මට්ටමක් වී තිබුණි. පොල් සංවර්ධන නිලධාරි කොට්ඨාශ 11 න් 03 ක ප්‍රගතිය 0% ක් වී තබුණි.

(ආ) <u>පුනරුත්ථාපන සහනාධාරය</u>

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී පොල් අක්කර 10,000 ක් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් සහනාධාර ලබාදීමට ඉලක්කර කර තිබූ නමුත්, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව 2010 වර්ෂය අවසානයේදී අක්කර 7,046 ක් සඳහා පමණක් සහනාධාර ගෙවා තිබුණි. එහි භෞතික කාර්යසාධනය 70% ක් වුවත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් හා පොල් සංවර්ධන නිලධාරි කොට්ඨාශ මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී, ප්‍රාදේශීය කාර්යාල 17 න් කාර්යාල 05 ක හා පොල් සංවර්ධන නිලධාරි කොට්ඨාශ 162 න් කොට්ඨාශ 63 ක සමස්ථ කාර්ය සාධනය

50% කට වඩා අවම මට්ටමක් වී තිබුණි. පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ 63 න් 15 ක ප්‍රගතිය 0% ක් වී තිබුණි.

(ඈ) **ගෙවතු වගා සහනාධාරය**

ගෙවතු වගා වැඩ සටහන යටතේ පොල් පැළ 800,000 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට පොල් පැළ 757,853 ක් බෙදා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය 94% ක වුවත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් හා පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී, ප්‍රාදේශීය කාර්යාල 17 න් කාර්යාල 03 ක හා පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ 162 න් කොට්ඨාශ 32 ක සමස්ථ කාර්ය සාධනය 50% කට වඩා අවම මට්ටමක් වී තිබුණි. පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ 32 න් 07 ක ප්‍රගතිය 0% ක් වී තිබුණි.

(ඈ) **පොහොර සහනාධාරය**

පොල් නිෂ්පාදනය වැඩි කිරීමේ අපේක්ෂාවෙන් පොල් පොහොර මෙ:ටොන් 4,200 ක් සහනාධාර වශයෙන් ලබාදීමට ඉලක්ක කර තිබූ නමුත්, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසානය වන විට පොහොර මෙ:ටොන් 5,185 ක ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. එහි භෞතික කාර්යසාධනය 123% ක් වුවත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් හා පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී, ප්‍රාදේශීය කාර්යාල 17 න් කාර්යාල 04 ක හා පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ 162 න් කොට්ඨාශ 30 ක සමස්ථ කාර්ය සාධනය 50% කට වඩා අවම මට්ටමක් වී තිබුණි. ප්‍රාදේශීය කාර්යාල 04 න් කාර්යාල 03 ක ප්‍රගතිය 0% ක් ද, පොල් සංවර්ධන නිළධාරි කොට්ඨාශ 30 න් 10 ක ප්‍රගතිය 0 % ක් වී තිබුණි.

2.2.2 **ජාතික පොල් ඵලදාව පහත වැටීම**

පොල් ඵලදාව වර්ධනය කිරීම සඳහා සහනාධාර ලබාදීම වෙනුවෙන් මණ්ඩලය විසින් 2000 සිට 2010 දක්වා රු. මිලියන 1,736 ක වියදමක් දරා තිබුණි. එසේම සහනාධාර වලින් අපේක්ෂිත පරමාර්ථ ලඟා කර ගැනීම සඳහා ඵලදායි හා කාර්යක්ෂම ව්‍යාප්ති සේවා වැඩ සටහනක් අවශ්‍ය වන බව මණ්ඩලය විසින් හඳුනාගෙන ඒ සඳහා 2000 සිට 2010 දක්වා රු. මිලියන154 ක වියදමක් දරා තිබුණි. නමුත් 2009 හා 2010 වර්ෂ වල මහ බැංකු වාර්තා අනුව 2000 දි ගෙඩි මිලියන 3,096 ක් වූ ජාතික පොල් ඵලදාව 2010 වන විට ගෙඩි මිලියන 2,317 දක්වා එනම් පොල් ගෙඩි මිලියන 779 කින් අඩු වී තිබුණි. මෙම පොල් ඵලදාව 2000 වර්ෂයට සාපේක්ෂව 25% ක අඩු වීමකි. 2000 වර්ෂයේදි පොල් වගාව සඳහා හෙක්ටයාර 444,000 ක් වූ ඉඩම් භාවිතය 2010 වර්ෂය වන විට හෙක්ටයාර 395,000 ක් දක්වා අඩුවීම පොල් ඵලදාව අඩුවීමට බලපා තිබුණි. තවද පොල් වගාකරුවන් විසින් පොල් සඳහා පොහොර භාවිතය ක්‍රමයෙන් අඩුවීමද මේ සඳහා බෙහෙවින් බලපා තිබුණි. 2006 වර්ෂයේදි මෙ. ටොන් 36,000 ක පොහොර ප්‍රමාණයක් පොල් වගාව සඳහා භාවිතා කළ ද 2009 වන

විට එය පොහොර මෙ. ටොන් 17,000 ක් දක්වා හරි අඩකට වඩා වැඩි ප්‍රමාණයකින් අඩු වී තිබුණි.

## 2.2.3 ආදර්ශ පොල් උයන්

2010 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 09 ක් සහ ආදර්ශ මධ්‍යස්ථාන වශයෙන් වතු 02 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණි. උක්ත පොල් උයන් සහ ආදර්ශ මධ්‍යස්ථාන වල පසුගිය වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ පොල් එලදාව පිළිබඳ දත්තයන් කිහිපයක් පහත දැක්වේ.

| ආදර්ශ පොල් උයන/ ආදර්ශ මධ්‍යස්ථාන | වගා කර ඇති භූමි ප්‍රමාණය (අක්කර) | එල දරන ගස් සංඛ්‍යාව | කඩන ලද පොල් ගෙඩි ගණන | වැටුණු පොල් ගෙඩි ගණන | වාර්ෂික අස්වැන්න ගෙඩි | වැටුණු පොල් ප්‍රතිශතය % | ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි | අක්කරයකට එලදාව ගෙඩි |
|---|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | 347 | 16,257 | 513,147 | 444,294 | 957,441 | 46 | 59 | 2,759 |
| රත්දෙණිය | 311 | 12,990 | 452,434 | 246,781 | 699,215 | 35 | 54 | 2,248 |
| ලේනව | 416 | 15,797 | 682,611 | 119,322 | 801,933 | 15 | 51 | 1,928 |
| බෝපිටිය | 104 | 5,704 | 205,280 | 152,399 | 357,679 | 43 | 63 | 3,439 |
| ගර්ට්ලන්ඩ් | 388 | 13,850 | 524,631 | 342,302 | 866,933 | 39 | 63 | 2,234 |
| කොරෙයි | 175 | 5,423 | 163,342 | 21,858 | 185,200 | 12 | 34 | 1,058 |
| පාසිකුඩා | 88 | 3,732 | 78,337 | 8,065 | 86,402 | 9 | 23 | 982 |
| මහයාය | 271 | 11,865 | 594,762 | 388,129 | 982,891 | 39 | 83 | 3,627 |
| ඩේසිවැලි | 299 | 14,653 | 528,185 | 287,128 | 815,313 | 35 | 56 | 2,727 |
| මුන්දලම | 14 | 710 | 74,765 | 6,649 | 81,414 | 8 | 115 | 5,815 |
| කොහොඹාන | 82 | 3,417 | 65,819 | 30,712 | 96,531 | 32 | 28 | 1,177 |
| **එකතුව** | **2,495** | **104,398** | **3,883,313** | **2,047,639** | **5,930,952** | **35** | **57** | **2,377** |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2010 වර්ෂයේ මුළු පොල් එලදාව ගෙඩි මිලියන 5.93 ක් විය. එය 2008 හා 2009 වර්ෂවල පැවති පිළිවෙලින් ගෙඩි මිලියන 6.07 හා 7.15 ක් වූ මුළු පොල් එලදාවට වඩා අඩු එලදාවකි. මෙය 2009 වර්ෂයට සාපේක්ෂව 17% ක අඩුවීමකි.

(ආ) සාමාන්‍ය තත්වයන් යටතේ පොල් වගා බිම් අක්කරයකින් වාර්ෂිකව අවම වශයෙන් පොල් ගෙඩි 4500 -5000 අතර ප්‍රමාණයකින් පොල් එලදාවක් ලබා ගත හැකි වුවත් සමස්ථයක් ලෙස මණ්ඩලය සතු ඉඩම් වලින් එම සාමාන්‍ය මට්ටමවත් ලඟා කර ගැනීමට අපොහොසත්

වී තිබුණි. මණ්ඩලයේ සාමාන්‍ය පොල් ඵලදාව අක්කරයකට ගෙඩි 1000 - 3000 ත් අතර විය.

(ඈ) ආදර්ශ පොල් වතු 11 න් වතු 05 ක තථ්‍ය පොල් ඵලදාවේ කාර්ය සාධනය අවම මට්ටමක පැවති අතර එයින් කොහොඹාන ආදර්ශ පොල් උයනෙහි කාර්ය සාධනය 40% වශයෙන් ඉතා අවම මට්ටමක පැවතුණි.

(ඇ) පොල් පර්යේෂණ මණ්ඩලය මගින් මාසික අස්වැන්න නෙලිමේ වාසිය අධ්‍යනය කිරිමේ පර්යේෂණයේ නිර්දෙශ ප්‍රකාර වතු ක්ෂේත්‍රය තුල මාසිකව පොල් නෙළිමට උපදෙස් දී තිබුණි. පොල් පර්යේෂණ මණ්ඩලය මගින් නඩත්තු කරන පර්යේෂණ හා ජාන සම්පත් මධ්‍යස්ථාන වල මුර 11 ත් 12 ත් අතර වැඩි වාර ගණනකදී පොල් අස්වැන්න නෙලිම තුලින් 2010 වර්ෂයේදි වැටුණු පොල් ඵලදාව 14% ක් දක්වා වූ අඩු මට්ටමක තිබුණ ද පොල් වගා කිරිමේ මණ්ඩලය මගින් නඩත්තු කරන ආදර්ශ පොල් උයන් වල මුර 07 ත් 08 ත් අතර අඩු වාර ගණනක් තුල අස්වැන්න නෙලිම හේතුවෙන් වැටුණු පොල් ප්‍රතිශතය 35% ක් දක්වා ඉහල අගයක් ගෙන තිබුණි.

(ඉ) <u>අතුරුභෝග හා පොල් පැල නිෂ්පාදනය</u>

කොරෙයි, ඩේසිවැලි යන ආදර්ශ පොල් උයන් වල පවත්වා ගෙන ගිය පොල් පැල නිෂ්පාදනයෙන් ලත් ආදායමට වඩා වියදම අධික වි තිබු බැවින් ඒවායෙන් සමාලෝචිත වර්ෂයේදි රු.355,864 ක අලාභයක් සිදු වී තිබුණි.

2.3.4 <u>පොල් වගා භූමි ඌන උපයෝජනය</u>

සමස්තයක් ලෙස මණ්ඩලය නඩත්තු කරන ආදර්ශ පොල් උයන් 11 කට අයත් පොල් වගාකර ඇති බිම් ප්‍රමාණය අක්කර 2,495 ක් වුවත් ඒවායේ 2010 දෙසැම්බර් 31 දිනට ඵලදරන පොල් ගස් ප්‍රමාණය 104,398 ක් විය. එනම් අක්කරයකට ඵලදරන පොල් ගස් ප්‍රමාණය 42 ක් තරම් වූ අඩු ප්‍රමාණයකි. එය අක්කරයකට සම්මත පොල් ගස් 64 ක ප්‍රමාණයෙන් 65% ක් විය. ඒ අනුව පොල් වගාකර ඇති භූමි ප්‍රමාණයෙන් 1/3 ක් ඌන උපයෝජිත භූමිය වශයෙන් පැවතුණි.

2.3 <u>හඳුනාගත් පාඩු</u>

අ) 2009 හා 2010 වර්ෂ වලදි මණ්ඩලයේ වාහන අනතුරු18 ක් සිදුවී තිබු අතර එම අනතුරට ලක් වූ වාහන අළුත්වැඩියාව සඳහා රු.1,930,630 ක් වැය කර තිබුණි කෙසේ නමුත් මේ සඳහා රක්ෂණ වන්දි වශයෙන් රු.1,451,668 ක් පමණක් ලැබී තිබුණි. ශේෂය වූ රු.478,962 ක් මණ්ඩලයට වැය බරක් වී තිබුණි.

ආ) මණ්ඩලයේ කළමනාකරණ තිරණයක් මත නිලධාරියකුගේ සේවය අනුමිත ලෙස අවසන් කිරිම හේතුවෙන් කම්කරු විනිශ්චය සභාවේ නියෝග මත මණ්ඩලයට රු.748,440 ක

මුදලක් වන්දි වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි. කෙසේ නමුත් මෙම නඩු තීන්දුවට විරුද්ධව මණ්ඩලය විසින් කොළඹ පළාත්බද මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර දැනට එය විභාග වෙමින් පවතින බවට සභාපතිවරයා පිළිතුරු දී තිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැතියන්
(ඇ) විගණන හා කළමනාකරණ කමිටු
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) සහනාධාර ගෙවීම්
(ඊ) පොල් පැල නිෂ්පාදනය
(උ) වතු කළමණාකරණය
(ඌ) ආදර්ශ පොල් උයන්